

Zurab Burduli/ICRC

## අපගේ ක්‍රියාකාරිත්වය

සියලු තත්ත්වයන්වලදී ICRC රැඳවුම් බලධාරීන් සමඟ එක්ව වැඩකරන අතර, එම බලධාරීන්, රැඳවියන්ට මානුෂීය අන්දමින් සැලකීමට සහ මානුෂීය රැඳවුම් තත්වයන් සුරක්‍ෂිත කිරීමට අවශ්‍ය පියවර ගනු ඇතැයි අපේක්‍ෂා කරයි. එය සපුරා ගැනීම පිණිස ICRC තමන් සොයාගත්, අවධානය යොමු විය යුතු කරුණු පිළිබඳව, අදාල ජාතික සහ අන්තර් ජාතික ප්‍රමිතීන් පිළිබඳව සහ නිදහස අහිමි වූ පුද්ගලයින් ගේ තත්වය වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග සහ සම්පත් පිළිබඳව බලධාරීන් සමඟ රහස්‍ය ද්විපාර්ශවික සංවාද පවත්වයි.

ඒ ඒ තත්වයන් පිළිබඳව තමන් විසින් කෙරෙන තක්සේරුව සහ සමාලෝචන පදනම් කොට ගෙන ICRC රැඳවියන්ගේ අවශ්‍යතා වඩාත් කාර්යක්‍ෂම ලෙස සපුරාලීමට විශේෂිත ක්‍රමෝපායක් සකස් කරයි. මෙම ක්‍රමෝපායට ICRC විසින් රැඳවියන්ට, ව්‍යුහයන්ට, ආයතන සහ නියාමන රාමුවලට අදාලව ගන්නා ක්‍රියා මාර්ග මෙන්ම මානුෂවාදී අවශ්‍යතා සපුරාලීම උදෙසා කරන විවිධ ද්‍රව්‍යමය හෝ තාක්ෂණමය මැදිහත්වීම්ද ඇතුලත්වේ. ICRC තම ක්‍රමෝපාය ක්‍රියාත්මක කරන කාලය පුරාවටම එය එහි ක්‍රියාකාරකම් මගින් රැඳවියන්ගේ තත්වය කෙරෙහි සාධනීය බලපෑමක් ඇතිවන බවට වගබලා ගැනීම සඳහා ක්‍රමෝපාය නිරීක්ෂණය කිරීමේ සහ සංශෝධනය කිරීමේ නිරත වෙයි.

ICRC

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව
29, ලෙයාඩ්ස් පාර කොළඹ 5
ශ්‍රී ලංකාව
දු.ක. +94-11-2503346
www.icrc.org
© ICRC 2013

0543/259 06.2013 1000



# නිදහස අහිමි වූ පුද්ගලයින් ගේ ජීවිතයට සහ ඔවුන් ගේ අභිමානයට ගරු කිරීම

ICRC

Photo cover: Ron Haviv/ICRC

IN BRIEF








## සිර ගත කිරීම්

සෑම දිනකම පිරිමින්ගේ, කාන්තාවන්ගේ සහ ළමයින්ගේ නිදහස අහිමි කෙරෙන සිද්ධි ඇති වන අතර ඔවුන් ඉක්මනින් මරණයට පත්කිරීම්, බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් සහ වද හිංසා වැනි අවදානම්වලට නිරාවරණය වේ. ඔවුන්ට තමන් ගේ පවුල් සමඟ ඇති සබඳතාව අහිමිවීමට ඉඩ ඇති අතර, ඔවුන්ට ප්‍රමාණවත් තරම් ආහාර, ජලය සහ සෞඛ්‍ය සේවා වැනි නොමැති අමානුෂික ජීවන තත්වයන් යටතේ දිවි ගෙවීමට සිදු විය හැක.

## 1870 සිට

1870 සිට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) නිදහස අහිමි කරන ලද පුද්ගලයින් ගේ මානුෂීය තත්වය වැඩිදියුණු කිරීමට ප්‍රයත්න දරා ඇත.

අන්තර් ජාතික සහ අන්තර් ජාතික නොවන ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන් සම්බන්ධයෙන් සිරභාරයට ගනු ලැබූ පුද්ගලයින් වෙනුවෙන් ICRC ඉටුකරන කාර්ය භාරය ප්‍රකටය. වෙනත් තත්වය-න්හිදිද නිදහස අහිමි කරන ලද පුද්ගලයින්ට අදාල සැලකිම සහ රැඳවුම් තත්වයන් වැඩිදියුණු කිරීමට හැකි සෑම අවස්ථාවකදිම ICRC ක්‍රියා කරයි.

2010 දි ICRC රටවල් 71 ක රඳවා තබාගැනීම සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරතවූ අතර, අන්තර් ජාතික විනිශ්චය සභා 5 ක අධිබලය යටතේ රඳවාගනු ලැබ සිටින පුද්ගලයින් වෙනුවෙන්ද එවැනි ක්‍රියාකාරකම්වල නිරත විය.

මෙම සංවිධානයේ දූත පිරිස් පුද්ගලයින් රඳවාගනු ලැබ සිටින ස්ථාන 1,783 ක් වෙත 5,027 වාරයක් කළ සංචාර තුළදි නිදහස අහිමිව සිටින පුද්ගලයින් 500,928 දෙනෙකු හමුවීමට හැකිවිය.

## අපේ අරමුණු

නිදහස අහිමි කරනු ලැබ සිටින පුද්ගලයින්, ඔවුන් අත්අඩංගුවට ගැනු ලැබීමට හෝ රඳවාගනු ලැබීමට බලපෑ හේතුව කුමක් වුවත් ICRC හි අරමුණ වන්නේ එම සියලු දෙනාට මානුෂීය අන්දමින් සැලකීම සහ මානුෂීය රඳවා තැබීමේ තත්ත්වයන් සුරක්ෂිත කිරීමය. එම සංවිධානය විශේෂයෙන් රැඳවියන් සහ ඔවුන්ගේ පවුල් අතර සන්නිවේදන සබඳතා යළි ඇති කිරීම මගින් එවැනි පුද්ගලයින්ගේ පවුල්වල දුක් පීඩා පිටුදැකීමට උත්සාහ කරයි.

ICRC ප්‍රමුඛතාවක් වශයෙන් පුද්ගලයින්ට කෲර වධහිංසා පැමිණවීම සහ වෙනත් ආකාරයේ අමානුෂික සැලකීම වැලැක්වීමට, අතුරුදන්වීම් වැලැක්වීමට සහ ඒවාට විසඳුම් ලබාදීමට, රැඳවුම් තත්වයන් වැඩිදියුණු කිරීමට (උදාහරණ ආහාර, ජලය හා සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය), පවුල් සමඟ සබඳතා යළි ස්ථාපිතකොට පවත්වාගෙන යාමට සහ නෛතික රැකවරණ සඳහා ගරුකරන බවට වග බලා ගැනීමට ප්‍රයත්න දරයි. ඇතැම් අවස්ථා වලදි ICRC රඳවා ගනු ලැබ සිටි පුද්ගලයින්හට ආපසු සමාජයට පිවිසීමට පහසුකම් සපයමින් ඔවුන්ට ආධාර කරයි.

## අපගේ ප්‍රවේශය

ICRC පුද්ගලයින් රැඳවුම් භාරයේ තබා ගැනීම හා සම්බන්ධව කාර්යයන් ඉටුකරන්නේ රැඳවුම් මධ්‍යස්ථාන තුළ සහ පිටත පවතින තත්ත්වයන් පිළිබඳ පුළුල් තක්සේරුවක් පදනම් කර ගෙනයි. එම තක්සේරුව සඳහා පහසුකම් සැපයෙන්නේ පුද්ගලයින් රඳවා සිටින ස්ථාන භාර බලධාරීන් සමඟ පවත්වන එලදායි සංවාද සහ රැඳවියන් හමුවීමට යාම මගිනි. මෙම තක්සේරුව මූලික කොන්දේසි පහකට යටත්ව සිදු කරයි.

මෙහිදි ICRC වෙත පහත සඳහන් අවසර ලබා දිය යුතුය

- ඔවුන් උනන්දුවක් දක්වන විෂය ක්ෂේත්‍රයට අදාල සියලුම රැඳවියන් වෙත ප්‍රවේශවීමට අවස්ථාව.
- රැඳවියන් විසින් භාවිත කරනු ලබන සහ ඔවුන් සඳහා ඇති සියලු පරිශ්‍රයන් සහ පහසුකම් වෙත ප්‍රවේශය.
- රැඳවියන් සහ රැඳවුම් මධ්‍යස්ථාන වෙත කෙරෙන තම සංචාර නැවත සිදු කිරීමට.
- තෝරා ගත් රැඳවියන් සමඟ නිදහස්ව සහ පෞද්ගලිකව කථා කිරීමට.
- තමන් උනන්දුවක් දක්වන විෂය ක්ෂේත්‍රයට අදාල සියලුම රැඳවියන්ගේ ලැයිස්තුවක් බලධාරීන් විසින් ICRC වෙත සපයන බවට හෝ එවැනි ලැයිස්තුවක් තමන් විසින් සම්පාදනය කිරීමට

රැස්කරගත් තොරතුරු පසුව විශ්ලේෂණය කිරීම මගින් ICRC රැඳවියන් මුහුණපාන ප්‍රධාන අවදානම් සහ මානුෂවාදි අවශ්‍යතා සපුරාලීමට උත්සාහ දැරීමේදි, රැඳවුම් මධ්‍යස්ථාන භාර බලධාරීන් මුහුණපාන අභියෝග ඇතුළු රැඳවියන්ගේ තත්වයට බලපෑමක් ඇති සෙසු සාධක හඳුනා ගැනීමට හැකිවෙයි.